අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref. PTF/01/Circular/01

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.

දිනය / திகதி / Date 2020.03.31

චක්‍රලේඛ අංක : PTF/03-2020

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>උද්ගතවී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු.5000/- දීමනාවක් ගෙවීම</u>**

නව කොරෝනා වෛරසය නිසා එදිනෙදා ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධව සිටි ජන කොටස්වල ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම උදෙසා මේ වන විට රජය විසින් හඳුන්වා දී ඇති සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ වැඩිහිටි දීමනා, ආබාධිත දීමනා, සමෘද්ධි දීමනා, රෝගාබාධ දීමනා (පිළිකා සහ වකුගඩු) සඳහා පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් ග්‍රාමීය හෝ පළාත් පාලන කොට්ඨාශ මට්ටමින් පිහිටුවන කමිටුවක් විසින් නිරවුල්ව හඳුනාගෙන එම සියලු දෙනා වෙත එකවර ගෙවන දීමනාවක් වශයෙන් රුපියල් 5000/-ක දීමනාවක් ගෙවීමට රජය තීරණය කොට ඇත. මීට අදාළ වැඩිමනත් විස්තර ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/චක්‍රලේඛ/19/2020 හා 2020.03.30 දිනැති ලිපියේ දෙවන ඡේදයේ සඳහන් වේ.

මෙම සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් නිරවුල්ව හඳුනාගැනීම සඳහා සියලුම පළාත් පාලන ආයතනවල පළාත් පාලන කොට්ඨාශ 4917 (Ward) සඳහා එක් එක් කමිටුව බැගින් හෝ අවශ්‍ය නම් ග්‍රාම නිලධාරී වසමකට එක බැගින් (14022) ග්‍රාමීය කමිටු පිහිටුවා ගත යුතුය.

එම කමිටුවේ සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය යුතුය. එහි අවම වශයෙන් සාමාජිකයින් පස් දෙනෙකුවත් සිටිය යුතුය.

1. පළාත් පාලන කොට්ඨාශ නියෝජිත
2. ග්‍රාම නිලධාරී
3. කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී
4. සමෘද්ධි සංවර්ධන නිලධාරී
5. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී
6. ආර්ථික සංවර්ධන නිලධාරී

ඉහත නිලධාරීන්ගෙන් සමන්විත ග්‍රාමීය කමිටු රැස්වීම 2020.04.03 වන සිකුරාදා හෝ ඊට පෙර පැවැත්විය යුතු අතර, දැනට ප්‍රාදේශීය ලේකම් විසින් සකස් කර ඇති පොරොත්තු ලේඛනය, එම ග්‍රාමීය කමිටුවට ලබා දී අනුමත කරවා ගත යුතුය.

කාර්යාලය / அலுவலகம் / Gen. Office 2575317 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax 2574143 2575454 2575310
විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E-mail secpm@pmoffice.gov.lk

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දැනටමත් සකස් කර ඇති පොරොත්තු ලේඛනයට අමතරව, උක්ත කමිටුව විසින් ලබාගත් යාවත්කාලීන තොරතුරු මත, යම් සංශෝධන ඇතුළත් කළ යුතු නම්, එම කමිටුවට ඉදිරිපත් කර අනුමත කර ගත යුතුය.

එලෙස ඇතුළත් කරන සංශෝධන වෙතොත්, එකී කමිටුව විසින් නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම් වෙත දැන්විය යුතු අතර, විශේෂයෙන් ම එම සංඛ්‍යාව පොරොත්තු ලේඛනයට වඩා වැඩි වුවහොත්, එම වැඩිවූ සංඛ්‍යාව පහත සඳහන් ආකෘතියේ පරිදි කමිටුවේ සාමාජිකයින්ගේ නිර්දේශ හා අත්සන් සහිතව ප්‍රාදේශීය ලේකම්ට ඉදිරිපත් කළ යුතුය.

| ගෘහ මූලිකයාගේ නම හා ලිපිනය | පවුලේ සාමාජික සංඛ්‍යාව | රැකියාව | පොරොත්තු ලේඛනයට අලුතින් ඇතුළත් කිරීමට හේතුව | වෙනත් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

උද්ගතව ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් මෙම කමිටුව මගින් නිවැරදිව හඳුනාගෙන, එම ප්‍රතිලාභීන් සඳහා රු.5000/- දීමනාව ගෙවීම 2020.04.06 දින ආරම්භ කර 2020.04.09 දින හෝ ඊට පෙර අවසන් කිරීමට අපේක්ෂා කරන බැවින්, ඒ සඳහා අවශ්‍ය මූලික පරිපාලනමය කටයුතු කඩිනමින් සිදුකරන මෙන් කාරුණිකව දන්වමි.

මීට අදාළව ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් චක්‍රලේඛයක් ඉදිරියේ දී නිකුත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**ගාමිණී එස්.සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - අත්‍යාවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම
මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්යසාධන බලකාය

**පිටපත්:**

01. ජනාධිපති ලේකම්
02. ලේකම්, මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
03. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
04. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
05. සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන්

} කාරුණික දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා